දේශපාලන රැස්වීමක් බව වැටහී එම මධ්‍යස්ථානය භාරකරුවෝ තරමක් කළබලයට ද පත් වූහ.

සම්මන්ත්‍රණයේ දේශනාවක් පැවැත්වීමට ආරාධනා කිරීම සඳහා මහාචාර්ය විශ්වා වර්ණපාල හමුවීමට අමර සහ මම විශ්ව විද්‍යාලය තුල පිහිටා තිබූ ඔහුගේ නිල නිවසට ගියෙමු. විශ්ව විද්‍යාල භූමිය අපට තහනම් පෙදෙසක් වූ නිසා මේ සඳහා අප තෝරා ගත්තේ රාත්‍රී කාලයයි.

නිවසේ දොර විවෘත කර අප ශිෂ්‍යයින් බව හඳුනා ගත් මහාචාර්ය වර්ණපාල, ''ඔබට විශ්ව විද්‍යාලය තහනම් භූමියක් බව මා දන්නවා, ඒත් මගේ නිවස ශිෂ්‍යයින් ට සැමදා එකසේ විවෘතයි'' කියා ඉංගිරිසියෙන් පවසමින් ඉතා උණුසුම් ලෙස අප පිළිගත්තේය.

දේශනයක් පැවැත්වීම සඳහා වූ අපේ ආරාධනය පිළිගත් ඔහු පැයක් පමණ අප සාමීචියේ යෙදෙමින් නිදහස් අධ්‍යාපනයේ වටිනාකම ගැන ද, එජාප රජයේ පෞද්ගලික විශ්ව විද්‍යාල ප්‍රතිපත්තිය ගැනද ඔහු තම ප්‍රගතිශීලී අදහස් අප හා බෙදාගත්තේ ය. මෙහිදී වර්ණපාලයන් කියූ එක් කරුණක් තවමත් මගේ මතකයේ ඇත. එනම් සිය ආචාර්ය උපාධිය ගැනීමට එංගලන්තයට ගොස් සිටියදී ඔහු දුම්රිය පොළක පෝටර්වරයෙකු ලෙස සේවය කළ අයුරුත් ''බ්‍රිටිෂ් රේල්'' යැයි සටහන් කළ එක් නිල ඇඳුමක් ඔහු ලඟ තවමත් සුරක්ෂිතව තිබෙන බවත් ය. අමරත් මාත් මහාචාර්ය නිවසින් පිටව ආවේ ඉතා සතුටු සිතිනි.

මේ සම්මන්ත්‍රණයේ දේශන පැවැත්වීම සඳහා ආරාධනා ලැබුවන් අතර සිටි ආචාර්ය නලින් ද සිල්වා සහ ලබුදූවේ සිරිධම්ම හිමි මෙදින නො-පැමිණෙන බව දන්වා සිටියහ. සම්මන්ත්‍රණය සැලසුම් කරන දිනවල එහි මූලාසනය වැඩිදුර කතාබහ කිරීමට හැකියාවක් නැති නොවැදගත් අයෙකුට පැවරීමට අප තීරණය කර තිබුණෙන්, ඒ කර්තව්‍යය ඉබේම මට පැවරුණි. අවිශිබමය වෙනුවෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ තඹරළුවේ හිමියන් වේගවත් දෙසුමක් කළ අතර පේරාදෙනිය විශ්ව විද්‍යාලය නියෝජනය කරමින් කතා කළ අපේ ක්‍රියාකාරී කමිටු ලේකම් අමර ප්‍රකාශ කළේ ඒ වන විට ලංකාවේ පවතින අධ්‍යාපන අර්බුදය කෙතරම් ගැඹුරු ද යත් එහි ගැඹුර මැනීමට කිසිසේත් නොහැකි බවය.

සම්මන්ත්‍රණයේ වැදගත්ම දේශණය බවට පත් වූයේ මහාචාර්ය වර්ණපාල ගේ කතාවයි. අධ්‍යාපනයේ ඇති වැදගත් කම, නිදහස් අධ්‍යාපනය වැනි පොදු මාතෘකා යටතේ සාමාන්‍ය කරුණු රැසක් චතුර ලෙස ඉදිරිපත් කළ ඔහු අවසානයේ පොඩි පහේ නෝක්කාඩුවක් කරමින් අද රටට සේවය කරන උගතුන් ට සැලකීම අඩු බවද, විවේක ගැනීම සඳහා ඉදහිට යුරෝපයේ, ඇමරිකාවේ සිට මෙහි සැපත් වෙන ''බුල්''ජොන්ස්'' ලාට නම් ඉතාමත් ඉහල ගරු සත්කාර ලැබෙන බවද පැවසීය. ඔහු මේ සියුම් සරදම එල්ල කළේ ඒ දිනවල විටින් විට ලංකාවේ සංචාරය කරමින්, ලිපි පළකරමින්, දේශනා පවත්මින් සිටි ඇමරිකාවේ නිව්යෝර්ක් විශ්ව විද්‍යාලයේ ලෝක දේශපාලනය පිළිබඳ මහාචාර්යවරයෙකු වූ රැල්ෆ් බුල්ජන්ස් නම් ශ්‍රී ලාංකික උගතා පිළිබඳව ය.

මේ මහාචාර්යවරයා ඊට වසර කිහිපයකට පසුව ප්‍රසිද්ධ දේශණයක් පැවැත්වීමට යමින් සිටියදී පැහැර ගැනීමකට ලක් වූ අයුරු අනුර හොරේෂස් ලියූ ''ගිනි අවි සහ ගිනි කෙලි'' කෘතියේ විස්තර කර ඇත.

සම්මන්ත්‍රණ මූලාසනයේ සිටි මා මෙන්ම අසා සිටි බොහෝ දෙනෙකු ද මහාචාර්ය වර්ණපාල ගේ ඒ ''බුල්''ජොන්ස්'' සරදම වටහා ගත්තාට සැක නැත. නමුත් එයින් එක් අයෙකු හැර, අන් කිසිවෙකු ඒ ගැන ඉන්පසු වැඩිදුර නොසිතන්නට ඇත. ඒ වෙනත් කිසිවෙකු නොව, එදින සභාවේ සිටි, ''දි අයිලන්ඩ්'' පුවත් පතේ මහනුවර වාර්තාකරු ය.

අපේ කථිකයා මහාචාර්යවරයෙක් පමණක් නොව ශ්‍රීලනිපයේ දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙක් ද වීම, දින කිහිපයකට පසු ''දි අයිලන්ඩ්'' හි මුල් පිටුවේම, ''බුල්ජන්ස්මේන-යාව'' නමින් අපේ සම්මන්ත්‍රණයේ දී මහාචාර්ය වර්ණපාල කළ දේශණය පිළිබඳ පුවතක් පළවෙන්නට මූලික හේතුව වෙන්නට ඇත. මේ පිළිබඳව බුද්ධිමතුන් කිහිප දෙනෙක් අතර පුවත් පතේ ඇතිවුනු සංවාදය තරමක් කල් පැවතුනි.

මෙහිදී, මහාචාර්ය වර්ණපාලට ශිෂ්‍යයින් ගෙන් වැඩි සහයෝගයක් නොතිබුනු බව ට ඔහු ඒ දිනවල තරමක් අසතුටෙන් සිටි බව අපට පසුව ආරංචි විය. අනේ මහාචාර්ය තුමනි, ඔය තල්මස්සුන්ගේ යුද්ද මැද්දේ අප වැනි හාල්මැස්සන් කුමක් නම් කියා කරන්න ද?

ඒ දිනවල නම් මහාචාර්ය වර්ණපාල ශිෂ්‍යයන් ගේ ප්‍රශ්ණ තේරුම් ගත් සාධාරණ මිනිසෙකු වූ බවට අපට කිසි සැකයක් නොතිබුනි. කෙසේ වූව ද මා ඔහු දැන් වසර විසි දෙක හමාරකින් දැක නැත.

ර. චන්ද්‍රසූරිය
<ra.chandra.suriya@gmail.com>


TUTOR OF MATHEMATICS
AND SCIENCE/PHYSICS

Melbourne qualified Civil Engineer, Town Planner and Graduate of Latrobe University in teaching, Presently teaching in Government High School, is available for tutoring in the above subjects.

For further information please ring
0409 146 175/ 9460 6480
Tony Perera



**Setting up MYOB**
**Accounting/Bookkeeping Systems for small businesses**

According to the needs of
your business and the taxation regulations

**Guidance with running the system**

Very reasonable rates

**Phone: (03) 9889 1627**
**Email: shankottege@yahoo.com.au**


# මහජන බැංකුව ඔස්ට්‍රේලියාවේ කප්රුක සමග





''1961 දී මහජන බැංකුව පිහිටුවනු ලැබුවේ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජනතාවගේ සේවය සඳහායි'' ඔස්ට්‍රේලියාවේ කප්රුක ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ මුදල් තැන්පත්කරුවන්ගේ තරගයේ ජයග්‍රාහකයනට ත්‍යාග බෙදා දීමේ උත්සවයේදී මහජන බැංකුවේ ප්‍රධාන විදායක නිලධාරී සහ සාමාන්‍යාදිකාරී අසෝක ද සිල්වා මහතා පැවසුවේ ය. රැස්ව සිටි පිරිස ඇමතූ ඒ මහතා 1961 දී ආරම්භ කළ මහජන බැංකුවට මේ වන විට ශාඛා 600 කටත් වඩා ඇති බව ද ප්‍රකාශ කළේ ය. මේ උත්සවය 2008 ජනවාරි 13 වන දින මෙල්බන්හිදී පැවැත්විණ.

නොගෙවූ ණය හේතුවෙන් පසුගිය කාලයේ මහජන බැංකුවට යම් යම් දුෂ්කරතා වලට මුහුණ දෙන්නට සිදු වුව ද මේ වන විට ඒ සියල්ලෙන් මිදී අන්තර්ජාල බැංකු කටයුතු ඇතුළු නව තාක්ෂණය හඳුන්වා දෙමින් ඉදිරියටම යමින් තිබෙන බවද ඔහු පැවසී ය.

මහජන බැංකුවට විදේශ රට වල ශාඛා නොමැති වුවද ඔස්ට්‍රේලියාවේ කප්රුක ආයතනය ද ඇතුළත් ලොව පුරා විසිරුණ නියෝජිතයන් 200 ක පමණ වූ නියෝජිතජාලය මගින් සිය ගණුදෙනු පවත්වාගෙන යයි. කෝසල ජයසිංහ මහතාට මහජන බැංකුවෙන් ලද ආරාධනය අනුව ඔස්ට්‍රේලියාවේ කප්රුක ආයතනය බිහිවිය.

කප්රුක තරගයෙන් ජයග්‍රහණය කළ ලක්ෂ්මන් ගුණසේකර මහතාට හිමි ත්‍යාගය අසෝක ද සිල්වා මහතා අතින් පිරිනැමුණි.

ඔස්ට්‍රේලියාවේ පාරිභෝගිකයන් වෙනුවෙන් මනා සේවයක් ලබා දෙන මහජන බැංකුවටත් එහි නිලධාරීන් හා සේවක පිරිසටත් ස්තුති කළ කප්රුක ආයතනයේ අධ්‍යක්ෂ කෝසල ජයසිංහ මහතා පසුගිය අවුරුදු අටක කාලය තුළ තම ආයතනටය සහය දුන් සැමට ස්තුති කළේ ය.

The CEO and General Manager of the People's Bank Sri Lanka, Mr. Asoka de Silva and Senior Deputy General Manager, Mr. Vasantha Kumar visited Melbourne recently to award the winners of the Most Remittances competition held by Kapruka Pty Ltd. The awards ceremony was held on 13th January 2008.
Addressing the gathering, Mr. de Silva stated that People's Bank was established in 1961 to serve the ordinary people of Sri Lanka. This is what they have achieved over the years with the largest network of over 600 branches throughout the island including "uncleared areas".

A few years ago the People's Bank went through a rough time with ten large unpaid loans, but since then have recovered after a re-structuring strategy and by attracting outside talent.
Now it is implementing new technology that includes on-line banking and very soon the difference will be felt even by people in overseas countries.

This is the first time that a CEO of the People's Bank has visited Australia, which have enabled them to make a first hand assessment of the needs of the expatriate community.
Although Peopl's Bank does not have overseas branches, they work with over 200 overseas correspondents, including Kapruka Pty Ltd. It was the People's Bank that approached Mr. Kosala Jayasinghe to commence a remittance service using their facilities and that led to Kapruka Pty Ltd being established.

Mr. Vasantha Kumar, in his address mentioned that overseas remittances is the second larges income earner for Sri Lanka and it is taken very seriously, It is calculated that more than 70% of inward remittances from a country like Italy comes via unofficial channels thus denying the country of a sizeable income. Monies remitted via such unofficial channels are used to finance terrorism and for money laundering purposes. "Kapruka is doing a very good job for us" said Mr. Kumar.

The President of the Blind Association, Mr, Ivan Molloy, who is himself visually handicapped, was present at the occasion. He mentioned that they help many Blind Associations in the world among them Sri Lanka. In Sri Lanka they are given an accurate account of all funds sent and they know how every dollar is being spent. Therefore, a large amount of funds is allocated to Sri Lanka by his association, and Kapruka is providing a very efficient service at a subsidised fee, as this is a charity.

Mr. Asoka de Silva, presented two return air tickets to Colombo to the winner, Mr. Lakshman Gunesekera of the Kapruka Remittances Competition.
Managing Director, Kapruka Pty Ltd, Mr, Kosala Jayasinghe, thanked the People's Bank and their staff at the Overseas Customer Unit for their efficient service and the loyal Kapruka customers, assistants and well wishers for their support over the past eight years.